# 05 ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පෘතුගීසීන් යටතට පත්වීම


**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ දීර්ඝ ඉතිහාසය තුළ 16 වන සියවස දක්වා විදේශීය බලපෑම් මෙරටට එල්ල වූයේ අසල්වැසි ආසියාතික රටවලිනි. එහෙත් 16 වන සියවසේ සිට පෘතුගීසී, ලන්දේසී සහ ඉංග්‍රීසි යන යුරෝපා ජාතිකයෝ පිළිවෙළින් මෙරටට පැමිණ දිවයිනේ දේශපාලන ඉතිහාසය කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කළහ. 16 වන සියවසේ සිට 20 වන සියවසේ මැද වන තෙක් කාලපරිච්ඡේදයේ දී ඉන්දියාව, බුරුමය ඇතුළු ආසියාතික රටවල් රැසක් යුරෝපීයන්ට යටත්ව තිබූ හෙයින් මේ කාලයේ දී ශ්‍රී ලංකාව කෙරෙහි යුරෝපීය බලපෑම් එල්ලවීම පුදුමයට කරුණක් නොවේ. මෙම පරිච්ඡේදයේ දී පෘතුගීසීන්ගේ අවධානය ශ්‍රී ලංකාවට යොමු වීම, ඔවුන් මෙරටට පැමිණෙනවිට පැවති දේශපාලන තත්වය, පෘතුගීසීන්ගේ ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ලක්ෂණ හා ඔවුන්ගෙන් මෙරටට එල්ල වූ සමාජ, ආර්ථික බලපෑම් පිළිබඳ අවධානය යොමු කෙරේ.

## 5.1 පෘතුගීසීන්ගේ අවධානය ශ්‍රී ලංකාවට යොමු වීම

පෘතුගීසි ජාතික වස්කෝදගාමා ඉන්දියාවට පැමිණ වැඩිකල් යාමට පෙර ශ්‍රී ලංකාව පිළිබඳ පෘතුගීසීන්ට යම් යම් කරුණු දැනගැනීමට ලැබිණ. ශ්‍රී ලංකාවේ ඉතා හොඳ තත්වයේ කුරුඳු වැවෙන බව ඔවුහු මේ වන විට දැන සිටියහ. සමකාලීනව යුරෝපා වෙළෙඳපොළේ කුරුඳු වැනි කුළුබඩුවලට ඉහළ ඉල්ලුමක් පැවති බැවින් ශ්‍රී ලංකාව සොයා ගැනීම කෙරෙහි පෘතුගීසින්ගේ අවධානය යොමු වී තිබිණ.


පෘතුගීසීන් මේ වන විට ශ්‍රී ලංකාව දැන සිටියේ ''සෙයිලන්'' යන නාමයෙනි. පෘතුගාලයේ රජු 1505 වර්ෂයේ දී ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා නම් සෙන්පතියා පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා වශයෙන් පත් කොට එවීමේ දී ''සෙයිලන් ''දූපත සොයාගත යුතු යැයි අල්මේදාට උපදෙස් ලබා දී ඇත. මෙසේ පෘතුගීසීන් ලංකාව සමග



*රූපය 5.1 පෘතුගීසි සිරකරුවන් ලවා විමලධර්මසූරිය රජු බලකොටුවක් ඉදි කිරීම*



*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*




සිතියම 5.1 *දහසයවන සියවසේ මුල් කාලයේ ශ්‍රී ලංකාව*

සබඳතා ඇති කර ගැනීමට උත්සාහ කරමින් සිටි අවධියේ දී ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදාගේ පුත් ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු පිරිස 1505 දී අහම්බෙන් මෙරටට පැමිණියහ.

> **ලොරෙන්සෝ ද අල්මේදා ශ්‍රී ලංකාවට පැමිණීම**
>
> ඉන්දියන් සාගරයේ යාත්‍රා කරන මුස්ලිම් වෙළෙඳ නැව් අල්ලා ගැනීමේ මෙහෙයුමක යෙදී සිටි ලොරෙන්සෝ ද අල්මේදා ඇතුළු කණ්ඩායම කුණාටුවකට හසු වී 1505 දී අහම්බෙන් මෙරටට ගොඩබැස්සහ.

## පෘතුගීසීන් පැමිණෙන විට මෙරට පැවති දේශපාලන තත්වය

පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණි අවධියේ කෝට්ටේ, කන්ද උඩරට සහ යාපනය වශයෙන් රාජධානි තුනක් මෙරට දක්නට ලැබුණි. මේ වන විට අටවන වීර පරාක්‍රමබාහු රජු කෝට්ටේ රාජ්‍යයේ පාලකයා වශයෙන් ක්‍රියා කළේ ය. සේනා සම්මත වික්‍රමබාහු රජු උඩරට රාජධානියේ පාලකයා ලෙස කටයුතු කළ අතර යාපන රාජධානියේ පාලකයා වශයෙන් පරරාජසේකරම් රජතුමා කටයුතු කරමින් සිටියේ ය.

මීට අමතරව වන්නි නායකවරුන් යටතේ වන්නි ප්‍රදේශ පාලනය විය. එහි පාලකයෝ බොහෝ විට ප්‍රධාන රාජධානියකට යටත්ව ක්‍රියා කළහ. දහසය වන සියවස ආරම්භ වන විට මෙරට පැවති රාජධානි අතුරින් කෝට්ටේ රාජ්‍යයට ප්‍රමුඛ තැනක් ලැබිණ. මෙරටට පැමිණි පෘතුගීසීහු ප්‍රථමයෙන් කෝට්ටේ රාජ්‍ය සමඟ සබඳතා ඇති කර ගත්හ.

## පෘතුගීසින් හා කෝට්ටේ රාජ්‍ය අතර සම්බන්ධතා

ශ්‍රී ලංකාවට පෘතුගීසීන් පැමිණි අවධියේ දී කෝට්ටේ පාලකයා වූ අටවන වීරපරාක්‍රමබාහු රජු මහලු වියේ සිටි බව පෙනේ. මෙම රජුට ධර්ම පරාක්‍රමබාහු, විජයබාහු ආදී පුතුන් කිහිප දෙනෙකු සිටි අතර පිය රජු යටතේ ධර්ම පරාක්‍රමබාහු කුමරා කෝට්ටේ පාලන කටයුතු හසුරවමින් සිටියේ ය. අනෙක් කුමාරවරු රාජධානියේ සෙසු ප්‍රදේශ භාරව ක්‍රියා කළහ.

පෘතුගීසීන් කොළඹ වරායට ගොඩබැසීමෙන් පසු කෝට්ටේ පාලකයා හමුවට තම නියෝජිතයන් යැවූ බව වාර්තා වේ. මෙහි දී රජුගේ නියෝජිතයෝ කොළඹ වරාය හා කෝට්ටේ රාජ්‍ය අතර විශාල දුරක් ඇතැයි පෙන්වීමට වට වංගු සහිත මාර්ගයකින් පෘතුගීසි නියෝජිතයන් කෝට්ටේ රජවාසලට කැඳවාගෙන ගියේ යැයි ජනප්‍රවාදයක් පවතින අතර එය පදනම් කරගනිමින් **''පරංගියා කෝට්ටේ ගියා වාගේ යැයි''** පිරුළක් නිර්මාණය වී තිබේ.

කෝට්ටේ පාලකයා සමග සාකච්ඡා කළ පෘතුගීසීහු එම රාජධානිය සමග වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීමට උත්සාහ කළහ. ඒ සඳහා රජුගේ අවසරය පරිදි වෙළෙඳ ගබඩාවක් ඉදි කිරීමට පෘතුගීසීන් කටයුතු කර ඇත. පෘතුගීසීන් මෙසේ කෝට්ටේ රාජ්‍ය සමඟ සබඳතා ඇති කර ගෙන වෙළෙඳ කටයුතුවලට උත්සාහ ගැනීම මෙරට සිටි මුස්ලිම් වෙළෙඳුන්ගේ කනස්සල්ලට හේතුවක් විය. පෘතුගීසීන් පැමිණෙන විට මෙරට හා විදේශ රටවල් අතර වෙළෙඳාමේ තනි අයිතිය (වෙළෙඳ ඒකාධිකාරය) මුස්ලිම් වෙළෙඳුන් අත පැවතිණ. මේ නිසා මුස්ලිම් වෙළෙන්දෝ කෝට්ටේ වැසියන්ගේ ද සහය ලබාගෙන පෘතුගීසින්ගේ කටයුතුවලට බලපෑම් කළහ. එහි ප්‍රතිඵල වශයෙන් වෙළෙඳ ගබඩාව තාවකාලිකව ඉවත් කර ගැනීමට පෘතුගීසීන්ට සිදු විය. මේ අතර පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයාගේ දැනුම්දීම පරිදි පෘතුගීසීන් විසින් වර්ෂ 1518 දී කොළඹ කොටුවක් ඉදි කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි.

වර්ෂ 1521 දී සිදු වූ **විජයබා කොල්ලය** නමින් හඳුන්වන දේශපාලන සිදුවීම නිසා කෝට්ටේ රාජ්‍ය බෙදී යාම පෘතුගීසීන්ට වාසි සහගත විය. අටවන වීර පරාක්‍රමබාහු රජුගෙන් පසු කෝට්ටේ පාලකයා බවට පත් වූ ඔහු පුත් හයවන විජයබාහු කුමරුට කීරවැල්ලේ බිසවකගෙන් ඉපදුණු කුමාරවරු තිදෙනෙක් වූහ. ඔවුහු බුවනෙකබාහු,

රයිගම් බණ්ඩාර, මායාදුන්නේ නම් වෙති. එකී මුල් බිසවගේ අභාවයෙන් පසු රජු තවත් බිසවක විවාහ කර ගත් අතර එම බිසවට දේවරාජ නමින් පුතෙක් සිටියේ ය. හයවන විජයබාහු රජු ඉහත පුතුන් තිදෙනාට උරුමය ලබා නොදී දේවරාජ කුමරුට එය පැවරීමට යාම නිසා ගැටුමක් ඇති විය. මෙහි දී බුවනෙකබාහු කුමරා ඇතුළු ඉහත කී සහෝදරවරු තිදෙනා උඩරට රජුගෙන් ද ආධාර ලබා රජවාසල වැටලූහ. මේ අවස්ථාවේ දී කිසියම් තැනැත්තෙකු විසින් විජයබා රජු ජීවිතක්ෂයට පත් කර ඇත. මෙය **විජයබා කොල්ලය** නමින් හැඳින්වේ. අනතුරුව කෝට්ටේ රාජ්‍ය රාජධානි තුනකට බෙදුණු අතර එක් එක් රාජධානියේ බලයට පත් වූ පාලකයන් පහත දැක්වේ.

- ✯ කෝට්ටේ - හත්වන බුවනෙකබාහු
- ✯ රයිගම - රයිගම් බණ්ඩාර
- ✯ සීතාවක - මායාදුන්නේ

විජයබා කොල්ලයෙන් කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදී යාමෙන් පසු කලක් ගතවන විට කෝට්ටේ රාජධානිය හා සීතාවක රාජධානිය අතර මතභේද ඇති විය. බුවනෙකබාහු රජු තමාගෙන් පසු උරුමය ස්වකීය මුණුපුරා වූ ධර්මපාල කුමාරයාට පැවරීමට ක්‍රියා කිරීමත්, මායාදුන්නේ ඊට එරෙහි වීමත් දෙපිරිස අතර ගැටුමක් ඇති වීමට බලපෑ ප්‍රධාන කරුණ විය. සීතාවක පාලක මායාදුන්නේ රයිගම් බණ්ඩාරගේ මරණයෙන් පසු රයිගම ප්‍රදේශය සීතාවකට ඈඳාගෙන කෝට්ටේ රාජධානිය තුළත් තම බලය පැතිරවීමට උත්සාහ කළේ ය. එහි දී බුවනෙකබාහු රජු තම ආරක්ෂාව සඳහා පෘතුගීසීන් කැඳවා ගත්තේ ය. අහම්බෙන් දිවයිනට පැමිණි පෘතුගීසීන් කෝට්ටේ ආරක්ෂකයන් වශයෙන් එහි කටයුතුවලට ඇගිලි ගැසීම ආරම්භ කළේ ඒ ආකාරයෙනි.

සත්වන බුවනෙකබාහු රජු පෘතුගීසි සහය ලබා ගත්ත ද හෙතෙම පෘතුගීසි ගැති පාලකයෙකු නොවී ය. කෝට්ටේ රාජ්‍යයේ වෙළෙඳ ද්‍රව්‍ය පෘතුගීසීන් ඉතා අඩු මිලකට ලබා ගැනීමත් කෝට්ටේ වැසියන්ට පීඩා කිරීමත් නිසා පෘතුගීසීන් පිළිබඳ රජු තුළ කලකිරීමක් ඇති විය. එහි අවසන් ප්‍රතිඵලය වූයේ පෘතුගීසි සොල්දාදුවකුගේ වෙඩි පහරින් බුවනෙකබාහු රජු මිය යාම යි. අනතුරුව 1551 දී පමණ ධර්මපාල කුමරු කෝට්ටේ පාලකයා බවට පත් විය.

> බුවනෙකබාහු රජුට සමුද්‍රදේවි නමින් දියණියක් සිටි අතර ඇය වීදිය බණ්ඩාර සමග විවාහ වී සිටියා ය. ධර්මපාල කුමරු යනු එම දෙපලගේ පුතෙකි. ඒ අනුව ධර්මපාල කුමරු බුවනෙකබාහු රජුගේ මුණුපුරා විය.

බුවනෙකබාහු රජු ජීවත්ව සිටිය දී ම ධර්මපාල කුමරුගේ රන් පිළිරුවක් පෘතුගාලයේ රජු වෙත යවා එයට ඔටුනු පැළඳවී ය. එමගින් කෝට්ටේ අනාගත පාලකයා ගැන පෘතුගීසීන් තුළ පිළිගැනීමක් ඇති කර තිබිණ. ධර්මපාල කුමරු කෝට්ටේ පාලකයා වීමත් සමඟ ඔහුගේ ආරක්ෂකයන් වූ පෘතුගීසීන්ගේ බලය ද හැම අතින් ම වැඩි විය. පෘතුගීසීන්ගේ බසට අවනතව කටයුතු කළ මේ රජතුමා කතෝලික ආගම වැළඳ ගෙන දොන් ජුවන් ධර්මපාල නමින් භෞතිස්ම ලැබී ය.



රූපය 5.2 *පෘතුගීසීන් විසින් සත්වන බුවනෙකබා රජුගේ මුණුබුරු ධර්මපාල කුමර අභිෂේක කිරීම දැක්වෙන කැටයමක්*

මෙසේ තම පාලකයා අන්‍ය ආගමක් වැළඳ ගැනීම ගැන කෝට්ටේ වැසියන් කලකිරුණු බව පෙනේ. ඒ වන විට කෝට්ටේ දළදා මැඳුරේ තැන්පත් කර තිබූ දළදාවට පවා ආරක්ෂාව නොතිබූ හෙයින් හිරිපිටියේ රාළ නම් දියවඩන නිළමේවරයා විසින් එය සීතාවකට වැඩමවන ලදි. මේ සමඟ බුද්ධවංශ හිමි වැනි භික්ෂූන් වහන්සේලා මායාදුන්නේ රජුට සහය දීමට පටන්ගත් අතර කෝට්ටේ වැසියන් බොහොමයකගේ සහය සීතාවකට ලැබුණු බව පෙනේ.

ධර්මපාල රජු කෝට්ටේ පාලකයා ලෙස සිටි අවධියේ දී පෘතුගීසීහු තමන්ට සිතැගි පරිදි කටයුතු කරමින් කෝට්ටේ වැසියන්ගේ භාණ්ඩ ඉතා අඩු මිලට ලබා ගෙන ස්වකීය භාණ්ඩ අධික මිලට විකුණමින් ලාභ ඉපයූහ. රජුගේ පියා වූ වීදිය බණ්ඩාර ඊට එරෙහිව නැගී සිටියත් ධර්මපාල රජු පෘතුගීසි රූකඩයක් මෙන් කටයුතු කළ බව දැකිය හැකි ය.

ධර්මපාල කෝට්ටේ පාලකයා වූ විට මායාදුන්නේ රජු නොකඩවා කෝට්ටේට ප්‍රහාර එල්ල කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය.

මෙසේ සීතාවකින් එල්ල වූ ප්‍රහාර නිසා වර්ෂ 1565 දී ධර්මපාල රජුට කෝට්ටේ නගරය අතහැරීමට සිදු විය. අනතුරුව පෘතුගීසි ආරක්ෂාව යටතේ ධර්මපාල රජු කොළඹ කොටුවේ ජීවත් වී ඇත.

වර්ෂ 1580 දී ධර්මපාල රජු තෑගි ඔප්පුවක් මගින් කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන්ට පවරා දුන්නේ ය. 1597 දී ධර්මපාල කුමරුගේ මරණයෙන් පසු කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන්ට අයත් විය.

## සීතාවක රාජධානිය

1521 වර්ෂයේ දී සිදු වූ විජයබා කොල්ලයේ එක් ප්‍රතිඵලයක් වශයෙන් සීතාවක රාජධානිය බිහි විය. සීතාවක යනු නූතන අවිස්සාවේල්ල නගරයට නුදුරුව කැලණි ගඟබඩ පිහිටි ප්‍රදේශයකි. කලින් කෝට්ටේ රාජධානියට අයත්ව තිබූ මෙම ප්‍රදේශයේ සීතාවක නගරය ගොඩනගාගත් මායාදුන්නේ රජතුමා අවට ප්‍රදේශ ආශ්‍රිතව සීතාවක රාජධානිය පිහිටුවා ගත්තේ ය.



රූපය 5.3

### අසවේදු

දොන් ජෙරොනිමෝ ද අසවේදු යනු දන්තුරේ සටනින් මෙරට පෘතුගීසි පාලකයා මිය යාමෙන් පසු කපිතාන් ජනරාල් බවට පත් වූ තැනැත්තා ය. ඔහු පැමිණෙන විට පහතරට ප්‍රදේශවල පෘතුගීසීන්ට එරෙහිව වැසියෝ නැගී සිටිමින් සිටියහ. මේ නිසා කෝට්ටේ වැසියන් මර්දනය කිරීමට අසවේදු ඉතා දරදඬු ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබේ.

ධර්මපාල රජුගේ මරණයෙන් පසු කෝට්ටේ දේශීය පරිපාලන නිලධාරීන් මල්වානට කැඳවූ අසවේදු ඔවුන් සමඟ සාකච්ඡා කොට කෝට්ටේ රාජ්‍ය තුළ අනාගත පාලනය ගෙන යන ආකාරය ගැන එකඟතාවක් ඇති කර ගත්තේ ය. එය 1597 මල්වාන ගිවිසුම ලෙස හැඳින්වේ.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## මායාදුන්නේ රජු

සීතාවක රාජධානියේ මුල් ම පාලකයා මායාදුන්නේ රජතුමා වේ. එතුමා හයවන විජයබාහු රජුගේ පුතෙකි. වර්ෂ 1521 සිට 1581 පමණ වන තෙක් මායාදුන්නේ රජු සීතාවක රාජධානිය පාලනය කළේ ය. මෙම රජු මුල සිට ම පෘතුගීසි විරෝධි ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. පෘතුගීසීන් ලංකාවට පැමිණ කෝට්ටේ රාජධානිය සමඟ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීම මෙරට සිටි මුස්ලිම් වෙළෙන්දන්ගේ කලකිරීමට හේතු විය. මේ නිසා පෘතුගීසීන්ට එරෙහිව මුස්ලිම් ජනයාගේ සහාය මායාදුන්නේට ලැබුණි. ඉන්දියාවේ වෙරළබඩ පිහිටි කැලිකට් රාජධානියේ පාලකයෙකු වූ සැමොරින්ගේ සහාය මායාදුන්නේට ලැබීමට ද එය හේතුවක් විය.

මායාදුන්නේ රජතුමා තම පාලන කාලය තුළ සීතාවක රාජධානියේ බලය ව්‍යාප්ත කළේය. රයිගම රාජධානියේ පාලකයා වූ රයිගම බණ්ඩාරගේ මරණයෙන් පසුව එම රාජධානියට අයත් ප්‍රදේශ මායාදුන්නේ රජු විසින් සීතාවක රාජධානියට ඈඳා ගන්නා ලදි. ඊට පසු කෝට්ටේ රාජධානිය සමඟ සටන් කරමින් එම රාජධානියට අයත් ප්‍රදේශ රැසක සීතාවක බලය පැතිරවීමට ද මායාදුන්නේ රජතුමා කටයුතු කළේ ය. ඉහත සඳහන් කළ පරිදි කැලිකට් රාජ්‍යයේ සැමොරින්ගේ සහය ලබාගෙන මායාදුන්නේ රජු පෘතුගීසීන්ට එරෙහිව අවස්ථා කිහිපයක දී සටන් මෙහෙයවූ නමුත් පෘතුගීසීන්ගේ නාවික ශක්තිය නිසා එම සටන්වලින් සාර්ථක ප්‍රතිඵල නොලැබුණි.

මායාදුන්නේ රජුට ටිකිරි බණ්ඩාර යනුවෙන් පුතෙකු සිටි අතර පියාගේ අභාවයෙන් පසුව හෙතෙම පළමුවන රාජසිංහ නමින් සීතාවක රජකමට පත් විය. පියා මෙන් ම දක්ෂ රණ ශූරයෙකු වූ ටිකිරි කුමරු නව යොවුන් අවධියේ සිට ම පියාගේ යුද්ධ කටයුතුවලට සහාය දුන් බව පෙනේ. මායාදුන්නේ රජුගේ මහලු අවධියේ දී ඔහු පියා වෙනුවෙන් රාජ්‍ය පාලන කටයුතු මෙහෙයවූ බවට ද පිළිගැනීමක් තිබේ.

## මුල්ලේරියා සටන

සීතාවක රාජධානියේ ඉතිහාසය සටන්වලින් පිරුණු එකකි. පෘතුගීසීන් සමඟත්, කෝට්ටේ හා උඩරට රාජධානිය සමඟත් සීතාවක පාලකයෝ විටින් විට සටන් වැදුණහ. එකී සටන් අතුරින් පෘතුගීසීන් හා සීතාවක හමුදාව අතර ඇති වූ මුල්ලේරියා සටනට ප්‍රමුඛ තැනක් ලැබේ.

මුල්ලේරියා සටන සිදු වූ අවධිය වන විට සීතාවක හමුදාවට නායකත්වය සපයන ලද්දේ ටිකිරි බණ්ඩාර හෙවත් පළමුවන රාජසිංහ රජු විසිනි. වීදියේ බණ්ඩාර සමඟ කළ සටන් ආදියෙන් ජය ලබා සිටි හෙතෙම නිර්භීත නායකයෙකු වශයෙන් සීතාවක හමුදාව මෙහෙයවමින් සිටියේ ය. මෙම කාලයේ දී ධර්මපාල රජු පෘතුගීසි හමුදාවක් හා කෝට්ටේ හමුදා පිරිසක් යොදවා සීතාවක බල ප්‍රදේශය ආක්‍රමණයට සැරසුණු බව **රාජාවලියේ** සඳහන් වේ. ඊට ප්‍රතිචාර වශයෙන් සීතාවක හමුදාව ද සටනට සැරසී ඇත. මෙම දෙපක්ෂය මුල්ලේරියාවේ දී හමුවීම නිසා එහි දී දරුණු සටනක් ඇති විය. සීතාවක හමුදාව ඉතා සංවිධානාත්මකව හා උපායශීලීව පෘතුගීසීන් වට කොට ප්‍රහාර එල්ල කළ බැවින් එම සටනෙන් පෘතුගීසීහු අන්ත පරාජයක් ලැබූහ. පෘතුගීසීන්ගේ පක්ෂයෙන් මියගිය පිරිස 1600ක් යැයි **රාජාවලියේ** සඳහන් වේ. මෙය පෙරදිග රටක දී පෘතුගීසීන් ලැබූ දරුණුතම පරාජයක් විය.

## පළමුවන රාජසිංහ රජු හා සීතාවක බල ව්‍යාප්තිය

මායාදුන්නේ රජුගේ අභාවයෙන් පසුව 1581 වර්ෂයේ දී පමණ පළමුවන රාජසිංහ රජු සීතාවක රජකමට පත් විය. සිය පියා මෙන් ම පෘතුගීසී විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළ මෙතුමා සීතාවක රාජධානියේ බලය ව්‍යාප්ත කිරීමට ද ක්‍රියා කළේ ය. රජ වී නොබෝ කලකින් ම හෙතෙම උඩරට පාලකයා වූ කරලියැද්දෙ බණ්ඩාර පලවාහැර එම රාජධානිය ද සීතාවකට



රූපය 5.4 *සීතාවක රාජධානි සමයේ ඉදි කෙරුණු බෙරැන්ඩි කෝවිල*

ඇඳා ගැනීමට පියවර ගත්තේ ය. මේ අනුව 1582 වර්ෂය පමණ වන විට මෙරට පෘතුගීසි බලය කොළඹ කොටුව ඇතුළු ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා කිරීමට පළමුවන රාජසිංහ රජුට හැකි විය. එතුමා අවස්ථා දෙකක දී කොළඹ කොටුව ආක්‍රමණය කර පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උත්සාහ කළේ ය. පෘතුගීසීන් සතු වූ අවි ආයුධ බලය හා නාවික ශක්තිය නිසා එම ප්‍රයත්නවලින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබුණි.

1587 වර්ෂයේ දී රාජසිංහ රජු දෙවන වර කොළඹ කොටුව ආක්‍රමණය කළ අවස්ථාවේ දී බේරෙ වැවේ ජලය, ඇළ මාර්ගයක් කපා මුහුදට බස්සවා කොටුවට ඇතුළු වීමට ප්‍රබල උත්සාහයක් දරා ඇත. මාස ගණනක් තිස්සේ කොළඹ කොටුව වටලා සීතාවක හමුදාව කොටුවට ඇතුළු වීමට උත්සාහ කළ නමුත් පෘතුගීසීන්ගේ නාවික බලය නිසා රජුගේ උත්සාහය අසාර්ථක විය. කෙසේ හෝ පළමුවන රාජසිංහ රජුගේ කාලයේ දී සීතාවක රාජධානියේ බලය උපරිම තත්වය දක්වා ව්‍යාප්ත වී තිබුණි. මෙසේ සීතාවක රාජධානියේ උන්නතියට තුඩු දුන් හේතු කිහිපයකි.

### සීතාවක රාජධානියේ උන්නතියට තුඩු දුන් හේතු

★ මායාදුන්නේ හා පළමුවන රාජසිංහ යන රජවරුන් රණශූරයන් වීම.

මෙම පිය පුතු දෙදෙනා ම දක්ෂ රණශූරයෝ වූහ. කෝට්ටේ රාජධානිය හා පෘතුගීසීන් සමඟ සටන් කරමින් ඔවුහු තම බල ප්‍රදේශ පුළුල් කර ගත්හ.

★ දළදාව සීතාවකට වැඩම කරවීම.

කෝට්ටේ පාලකයා වූ ධර්මපාල රජු කතෝලික ආගම වැළඳගැනීමත් සමඟ එවකට දළදාව භාරව සිටි ගිහි ප්‍රධානියෙකු වූ හිරිපිටියේ රාළ දළදාව සීතාවකට වැඩම කරවී ය. දළදාව හිමි පාලකයා රටේ නීත්‍යානුකූල පාලකයා ලෙස පිළිගැනුණු හෙයින් භික්ෂූන් වහන්සේලා ඇතුළු බෞද්ධ ජනතාවගේ සහාය සීතාවකට ලැබුණි.

★ සීතාවක රජවරුන් අනුගමනය කළ පෘතුගීසි විරෝධි ප්‍රතිපත්තිය

සීතාවක රජවරු දෙදෙනා ම පෘතුගීසි විරෝධි ප්‍රතිපත්තියක් අනුගමනය කළහ. පෘතුගීසීන්ගේ කටයුතු නිසා පහතරට ජනතාවට විවිධ දුක් ගැහැට විඳීමට සිදුව තිබුණි. මේ

නිසා පීඩනයට පත් සෙසු පහතරට වාසීන් වැඩි පිරිසක් හා මුස්ලිම් ජනතාව සීතාවකට සහාය දුන් බව පෙනේ.

★ රයිගම රාජධානිය හා උඩරට රාජධානිය සීතාවකට ඈඳා ගැනීම.

රයිගම බණ්ඩාරගේ අභාවයෙන් පසුව මායාදුන්නේ රජු විසින් රයිගම රාජධානියට අයත්ව තිබූ ප්‍රදේශ සීතාවකට ඈඳා ගන්නා ලදි. එසේ ම පළමුවන රාජසිංහ රජු, උඩරට පාලකයා වූ කරලියැද්දෙ බණ්ඩාර පලවා හැර එම රාජධානිය සීතාවකට ඈඳා ගත්තේ ය. මෙය සීතාවක රාජධානියේ බල ප්‍රදේශ පුළුල් වීමට තුඩු දුන් කරුණකි.

★ කෝට්ටේ රාජධානිය පරිහානියට යාම

හත්වන බුවනෙකබාහු රජුගෙන් පසු කෝට්ටේ රාජධානිය ශීඝ්‍රයෙන් පරිහානිය කරා ගමන් කළ බව පෙනේ. ඔහුගෙන් පසු බලයට පත් ධර්මපාල රජු පෘතුගීසින්ගේ රූකඩ පාලකයෙකු විය. මේ නිසා කෝට්ටේ රාජධානියට පැවති අභියෝග ජය ගැනීමට තරම් ඔහු දක්ෂයෙකු නොවී ය. කෝට්ටේ වැසියන්ගෙන් ඇතැමෙක් සීතාවකට සහාය දුන් බව පෙනේ. එම රාජධානියට අයත් ප්‍රදේශ බොහොමයක් ක්‍රමයෙන් සීතාවක රාජධානිය යටතට පත් විය.

## සීතාවක රාජධානියේ පිරිහීම

පළමුවන රාජසිංහ රජු යටතේ සීතාවක රාජධානිය බලවත් වුවත් ඔහු අවසාන කාලයේ අනුගමනය කළ ඇතැම් ප්‍රතිපත්ති නිසා එම රාජධානියේ පරිහානියට ද කරුණු සැලසුණු බව පෙනේ. සීතාවක පාලකයන් නිරන්තරයෙන් ගෙන ගිය යුද්ධ කිරීමේ ප්‍රතිපත්තිය රාජසිංහ රජුගේ බෞද්ධ විරෝධී කටයුතු, උඩරට සීතාවකට ඈඳා ගැනීමේ දී රාජසිංහ රජුට සහාය වූ වීරසුන්දර බණ්ඩාර පසුව මැරවීම, රාජසිංහ රජුගෙන් පසුව සීතාවක රාජධානියට නිසි උරුමකරුවෙකු නොසිටීම ආදිය සීතාවක රාජධානියේ පිරිහීමට බලපෑ කරුණු කිහිපයකි.



රූපය 5.5 *පෙතන්ගොඩ උයනේ වර්තමානයේ දක්නට ඇති කටු උණපඳුර*

එසේ ම පළමුවන විමලධර්මසූරිය රජු යටතේ උඩරට රාජධානිය සීතාවක රාජධානියෙන් මිදී ස්වාධීන වීම ද එම රාජ්‍යයේ පරිහානියට හේතුවක් විය.

පළමුවන රාජසිංහ රජු හා විමලධර්මසූරිය රජු අතර සිදු වූ සටනකින් පරාජය වී ආපසු සීතාවක බලා පැමිණෙන විට පෙතංගොඩ උයනේ දී පතුලේ උණකටුවක් ඇනීමෙන් ඇති වූ තුවාලයක් හේතුවෙන් රාජසිංහ රජු ජීවිතක්ෂයට පත් විය. රාජසිංහ රජුගෙන් පසුව සීතාවක රාජධානියට නිසි උරුමකරුවෙකු නොසිටි හෙයින් පෘතුගීසීන්ගෙන් එල්ල වූ ප්‍රහාරවලට මුහුණ දීමට හැකියාවක් නොලැබුණි. මේ නිසා රාජසිංහ රජු මියගොස් ඉතා කෙටි කාලයක දී සීතාවකට අයත් බොහෝ ප්‍රදේශ පෘතුගීසි පාලනයට යටත් විය.

| වර්ෂය | උඩරට රජු | පෘතුගීසි හමුදාව මෙහෙයවූ තැනැත්තා | පෘතුගීසීන් පරාජයට පත් කළ සටන සිදු වූ ස්ථානය |
|---|---|---|---|
| 1594 | I වන විමලධර්මසූරිය රජතුමා | පේරෝ ලෝපෙස් ද සූසා | දන්තුරේ |
| 1602 | I වන විමලධර්මසූරිය රජතුමා | දොන් ජෙරොනිමෝ ද අසවේදු | බලන |
| 1630 | සෙනරත් රජතුමා (සටන මෙහෙයවීම මහා ආස්ථාන කුමරු පසුව II රාජසිංහ රජු) | කොන්ස්තන්තිනු ද සා | රන්දෙනිවෙල |
| 1638 | II රාජසිංහ රජු | දියෝගෝ ද මේලෝ | ගන්නොරුව |

**සටහන 5.1 පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ පිළිබඳ වැදගත් තොරතුරු**

## පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ

සීතාවක රාජධානිය බිඳ වැටීමෙන් පසුව මෙරට පෘතුගීසි බලයට පැවති ප්‍රබලතම තර්ජනය වූයේ උඩරට රාජධානිය යි. මේ නිසා උඩරට රාජධානිය යටත් කර ගැනීම පෘතුගීසීන්ගේ ප්‍රධාන අරමුණක් වී තිබුණි. ඒ සඳහා අවස්ථා කිහිපයක දී ම පෘතුගීසීහු උඩරට ආක්‍රමණය කළහ. පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් 5.1 සටහනෙන් පෙන්නුම් කෙරේ.

එම සටහන දෙස බලන විට උඩරට යටත් කර ගැනීමට පෘතුගීසීන් ආක්‍රමණ හතරක් සිදු කර ඇති බව පෙනේ. එම ආක්‍රමණ සියල්ල ම පරාජයෙන් කෙළවර විය. දොන් ජෙරොනිමෝ ද අසවේදු හැරුණු විට උඩරට ආක්‍රමණවලට නායකත්වය දුන් ඉතිරි පෘතුගීසි කපිතන්වරු තිදෙනා ම ඒ ඒ සටන්වල දී ජීවිතක්ෂයට පත් වූහ. මෙසේ පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ සියල්ල ම අන්ත පරාජයෙන් කෙළවර වීමට බලපෑ හේතු කිහිපයක් තිබේ.

**පෘතුගීසීන්ගේ උඩරට ආක්‍රමණ අසාර්ථක වීමට හේතු**

**☆ සතුරු ආක්‍රමණවල දී උඩරට ජනතාවගේ සම්පූර්ණ සහාය රජුට ලැබීම**

උදාහරණ - පේරෝ ලෝපේස් ද සූසා මෙහෙයවූ ආක්‍රමණයේ දී දෝන කතිරිනා උඩරට රැජින වශයෙන් ප්‍රකාශයට පත් කළත් එහි ජනතාව එය නොපිළිගෙන පළමුවන විමලධර්මසූරිය රජුට සම්පූර්ණ සහාය ලබා දීම.

**☆ උඩරැටියන්ගේ සටන් උපක්‍රම හා රජවරුන්ගේ උපාය කෞශල්‍යය**

උදාහරණ - ආක්‍රමණවල දී රජු මහනුවර නගරය අතහැර ආරක්ෂිත ස්ථානයකට ගොස් පසුව සංවිධානය වී පෘතුගීසීන් සුදුසු ස්ථානයකට කොටු කර සම්පූර්ණ ශක්තිය යොදා පහර දීම.

**☆ පෘතුගීසීන්ගේ සහායට පහත රටින් ගිය ස්වදේශිකයන් උඩරට දී රජුට එකතු වීම.**

උදාහරණ - පෘතුගීසීන්ගේ සෑම ආක්‍රමණයක දී ම පාහේ මෙය සිදු විය. අසවේදුගේ ආක්‍රමණයේ දී පහත රටින් ගිය පිරිස් විශාල වශයෙන් රජුට එකතුවීම නිසා සටනේ දී ඉතිරි වූ හමුදාව සමඟ අසවේදුට පසු බැසීමට සිදු විය.

**☆ උඩරට රාජධානියේ පිහිටීම හා භෞතික පරිසරය උඩරැටියන්ට වාසිදායක වීම.**

පෘතුගීසීන් වෙරළබඩ සටන් සඳහා වැඩි දක්ෂතා දක්වූ පිරිසකි. උඩරට කඳු හෙල් ගංගා



*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

මිටියාවත් සහිත භූමිය උඩරැටියන්ට හුරු පුරුදු එකක් විය. උඩරැටියන්ගේ ක්ෂණික ප්‍රහාර, මාර්ග අවහිර කිරීම්, භූමියේ කොටු කර පහරදීම ආදිය පෘතුගීසීන්ට අවාසිදායක විය.

## යාපන රාජධානිය හා පෘතුගීසීන්

රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව උතුරු ප්‍රදේශය ආශ්‍රිතව යාපන රාජධානිය බිහි වූ අතර ආර්ය චක්‍රවර්තී නම් රජ පෙළපතක් විසින් එහි පාලන කටයුතු මෙහෙයවන ලදි. හයවන පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී යාපන රාජධානිය කෝට්ටේ රාජ්‍යයට යටත් කරනු ලැබුවත් පසුව යළි ස්වාධීන විය. පෘතුගීසීන් පැමිණි අවධිය වන විට පරරාජසේකරම් රජතුමා යාපන රාජධානිය පාලනය කළේ ය. 1519 වර්ෂයේ දී පළමුවන සන්කිලි රජු යාපනේ බලයට පත් වූ අතර ඔහුගේ කාලයේ දී පෘතුගීසීන් සමඟ ගැටුම් ආරම්භ විය. පෘතුගීසි පූජකයන් යාපන රාජධානියේ ඇතැම් ප්‍රදේශවල කතෝලික ආගම පැතිරවීමට ක්‍රියා කළ හෙයින් සංකිලි රජතුමා එයට එරෙහිව කටයුතු කළේ ය. මේ නිසා 1543 හා 1560 වර්ෂවල දී පෘතුගීසීන් යාපනයට හමුදා යැවූ නමුත් සංකිලි රජතුමා පෘතුගීසීන් සමඟ සාකච්ඡා කොට නැවත සාමය උදා කර ගත්තේ ය. සංකිලි රජුගේ දිගු කාලීන පාලන සමය 1561 වර්ෂයේ දී නිම වීමෙන් පසුව යාපනයේ රාජ්‍ය උරුමය සම්බන්ධයෙන් බල අරගලයක් ඇරඹුණි. එහි දී ඇතැමුන් පෘතුගීසි සහය සොයා යාම නිසා පෘතුගීසීන්ට පක්ෂපාත අය යාපනයේ සිංහාසනයට පත් කිරීමට හැකියාව ලැබුණි. යාපනයේ ඇතැම් රජවරු උඩරට රජවරුන් සමඟ හා ඉන්දියාව සමඟ සබඳතා පවත්වාගෙන යාම ගැන පෘතුගීසීහු කැමති නොවූහ. ඒ අනුව 1619 වර්ෂයේ දී පිල්ප් ද ඔලිවේරා යටතේ පෘතුගීසීන් විසින් යැවූ හමුදාවක් යාපන රාජධානිය යටත් කරන ලදි.



*රූපය 5.6 යාපනය නල්ලූර් කෝවිලට නුදුරුව පිහිටි යමුනාරි පොකුණ 15 වන සියවසේ දී පමණ ඉදි කරන ලදැයි විශ්වාස කෙරේ*




*නොමිලේ බෙදාහැරීම සඳහා ය.*

## 5.2 පෘතුගීසීන්ගේ දේශපාලන ආර්ථික හා සංස්කෘතික කටයුතු

**★ පෘතුගීසීන් යටතේ මුහුදුබඩ ප්‍රදේශවල පාලන කටයුතු**

පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට කෝට්ටේ, උඩරට හා යාපන රාජධානි තුළ එක් එක් රාජධානියට ආවේණික වූ පරිපාලන ක්‍රමයක් පැවතුණි. පෘතුගීසීන් මුලින් ම සබඳතා ගොඩනගා ගත් කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශ එවකට දිසා හතරකට බෙදා තිබුණි. ඒවා පහත සඳහන් වේ.




1597 වර්ෂයේ දී ධර්මපාල රජු මිය යාමෙන් පසු කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශවල පෘතුගීසි පාලනය ස්ථාපිත කෙරිණි. මෙම වර්ෂයේ දී එවකට මෙරට පෘතුගීසි කපිතාන් ජනරාල් වූ අසවේදු කෝට්ටේ ජන ප්‍රධානීන් මල්වානට රැස් කර අනාගත පාලනය ගෙන යන ආකාරය සාකච්ඡා කළේ ය. එහි දී එතෙක් පැවති පරිපාලන ක්‍රමය තවදුරටත් ගෙන යා යුතු බවට එකඟතාවක් ඇති විය. එය මල්වාන ගිවිසුම ලෙස හැඳින්වේ. කෝට්ටේ රාජධානිය තුළ කාලයක් තිස්සේ පැවති පරිපාලන ක්‍රමය වැසියන්ට හුරුපුරුදු එකක් වූ අතර එය පෘතුගීසීන්ගේ පරමාර්ථ ඉටු කර ගැනීමට ද ප්‍රමාණවත් බව පෘතුගීසීහු දැන සිටියහ. මේ අනුව පෘතුගීසීන් විසින් ද එකී සාම්ප්‍රදායික පරිපාලන ක්‍රමය සුළු වෙනස්කම් සහිතව තවදුරටත් ක්‍රියාත්මක කරන ලදි.

සාම්ප්‍රදායික පරිපාලන ක්‍රමය අනුව දිසාව පාලන පහසුව සඳහා කෝරළ, පත්තු හා ගම් වශයෙන් තවත් අනුකොටස්වලට බෙදා තිබුණි. ඒ අනුව එක් එක් පාලන ප්‍රදේශ භාර නිලධාරීන් පහත සඳහන් පරිදි දැක්විය හැකි ය.

| | |
|---|---|
| දිසාවනිය | - දිසාවේ |
| කෝරළය | - කෝරළේ විදානේ |
| පත්තුව | - අතුකෝරාළ |
| ගම | - ගම් මුලාදෑනියා |

### පෘතුගීසි පාලනයේ විශේෂ ලක්ෂණ

පෘතුගීසීන්ගේ පාලන ක්‍රමය අනුව ඔවුන් යටතේ පැවති මෙරට ප්‍රදේශවල ඉහළ ම දේශපාලන බලය පෘතුගාලයේ රජතුමාට හිමි විය. පෘතුගාලයේ රජුගේ අණ පරිදි ආසියාවේ පෘතුගීසීන් සතු වූ ප්‍රදේශ පාලනය කිරීමේ මධ්‍යස්ථානය ඉන්දියාවේ ගෝවේ පිහිටුවා තිබුණි. පෘතුගාල රජු පත් කළ ප්‍රතිරාජයා හෙවත් විසුරේවරයෙක් ගෝවේ පෘතුගීසි මධ්‍යස්ථානයේ කටයුතු මෙහෙයවී ය. මේ අනුව පෘතුගාලයේ රජු හැරුණු විට ආසියාවේ සිටි ඉහළ ම පෘතුගීසි නිලධාරියා ගෝවේ ප්‍රතිරාජයා විය. මෙරට සිටි පෘතුගීසි නිලධාරීන්ගේ ප්‍රධානියා හැඳින්වූයේ කපිතන් ජනරාල් යන නමිනි. කපිතන් ජනරාල්වරයාගේ සහය සඳහා උපදේශක සභාවක් පැවතුණි. මෙරට පෘතුගීසීන් සතු වූ ප්‍රදේශවල කටයුතු මෙහෙයවීමේ බලය කපිතන් ජනරාල් සතු විය.

### පෘතුගීසීන් යටතේ ආර්ථික කටයුතු

වෙළෙඳාමෙන් හා යටත් විජිත කටයුතුවලින් උපරිම ලාභ ලැබීම පෘතුගීසීන්ගේ ප්‍රධාන අරමුණක් විය. මේ නිසා ඔවුන්ගේ පාලන කාලයේ දී ආදායම් පාලනයට විශේෂ අවධානයක් යොමු කෙරිණ. පෘතුගීසීහු ආර්ථික අංශය විඩෝර් ද පැසෙන්ඩා නම් විශේෂ නිලධාරියකු යටතේ සංවිධානය කළහ. පෘතුගීසි ආර්ථික කටයුතු ප්‍රධාන අංශ දෙකක් යටතේ සංවිධානය විය.



රූපය 5.7 පෘතුගීසීන්ගේ බලපෑමෙන් මෙරට ඇඳුම් පැළඳුම් වෙනස් වූ ආකාරය

- ආදායම් රැස් කිරීම
- වෙළෙඳ ද්‍රව්‍ය පිටරට යැවීම (භාණ්ඩ අපනයනය)

ආදායම් පාලනය වඩාත් සංවිධානාත්මකව සිදු කෙරිණ. ආදායම් මාර්ගවලට අදාළ තොරතුරු (ඉඩම් පිළිබඳ) ලේඛනගත කිරීම විශේෂ ලක්ෂණයක් විය. එම ලේඛන '' තෝම්බු'' යනුවෙන් හැඳින්වේ.

ආදායම් එකතු කිරීම එතෙක් පැවති සාම්ප්‍රදායික ක්‍රමය යටතේ සිදු කෙරිණ. කුරුඳු වෙළෙඳාම ප්‍රධාන ආදායම් මාර්ගය විය. යුරෝපා රටවල ආසියාවේ නිෂ්පාදනය කළ කුළුබඩු (කුරුඳු වැනි) සඳහා ඉල්ලුමක් තිබිණ. මේ නිසා පෘතුගීසීහු කුරුඳු වෙළෙඳාමට වැඩි උනන්දුවක් දැක්වූහ.

පෘතුගීසීහු කුරුඳු වගා නොකළහ. ස්වභාවිකව වැවුණු කුරුඳු ලබා ගැනීමෙන් වෙළෙඳාම සිදු කෙරිණ.

කුරුඳු සම්බන්ධයෙන් ඔවුන් තුළ පැවති උනන්දුව නිසා වෙන ම දෙපාර්තමේන්තුවක් පිහිටුවිය. එය මහබද්දේ දෙපාර්තමේන්තුව ලෙස හැඳින්වේ. මහබද්දේ කපිතාන් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විය. ගම්වල කුරුඳු තලන්නන්ගේ කටයුතු මෙම නිලධාරියාට භාර විය.

පුවක්, ගම්මිරිස්, අලි ඇතුන්, මුතු මැණික් වෙළෙඳාම පෘතුගීසීන්ගේ තවත් ආදායම් මාර්ගයකි. අපනයනය කිරීම සඳහා හැකිතාක් මෙම භාණ්ඩ හා සතුන් ඒකරාශී කිරීම සුළු නිලධාරීන්ට අයත් කටයුත්තක් විය.

ආදායම් එකතු කිරීමට,

කනකපුල්ලේ
ලියන්නන්
මයෝරාළවරුන්

යන සුළු නිලධාරීන් පත් කර තිබුණි.

පුවක් හා ගම්මිරිස් විකිණීමේ අයිතිය පෘතුගීසි ආණ්ඩුවට පමණක් හිමි විය. අලි ඇතුන් සහ මුතු මැණික් ආදිය වෙළෙඳාම් කිරීමේ අයිතිය දේශීය හා මුස්ලිම් වෙළෙන්දන්ට අහිමි විය. වෙළෙඳාමේ ඒකාධිකාරී බලය පෘතුගීසි ආණ්ඩුවට පැවරී තිබුණි. මේ නිසා ශ්‍රී ලංකාවේ වෙළෙඳ කටයුතුවලින් පෘතුගීසීහු විශාල ධනයක් උපයා ගත්හ.

## පෘතුගීසීන් යටතේ කතෝලික ආගමේ ව්‍යාප්තිය

තමන් යටත් කර ගත් රටවල කතෝලික ආගම පැතිරවීම පෘතුගීසීන්ගේ මූලික අරමුණක් විය. මේ නිසා පෘතුගීසීන්ට අයත් වූ ප්‍රදේශවල ආගමික ප්‍රචාරක කටයුතු සඳහා රාජ්‍ය අනුග්‍රහය නොඅඩුව ලැබිණ.

## ආගමික නිකායන් මෙරටට පැමිණීම

ආගමික ප්‍රචාරක කටයුතුවල දී විවිධ නිකායන්ට අයත් පූජකවරු විශාල කාර්ය භාරයක් ඉටුකළහ. මේ සඳහා නිකායන් හතරකට අයත් පූජකවරු පෘතුගීසි පාලන කාලයේ දී මෙරටට පැමිණියහ. ඔවුහු මිෂනාරිවරුන් ලෙස හැඳින්වෙති.

- ☆ ප්‍රැන්සිස්කන්වරුන්
- ☆ ඩොමිනිකන්වරුන්
- ☆ ඔගස්ටීනියන්වරුන්
- ☆ ජේසුයිට්වරුන්

ප්‍රැන්සිස්කන්වරු, මෙරටට මුලින් ම පැමිණි මිෂනාරිවරුන් වෙති.

මෙම නිකායන් දිවයිනේ විවිධ ප්‍රදේශ භාරව ආගමික ප්‍රචාරක කටයුතුවලට නිරත වී ඇත.

| | |
|---|---|
| මාතර | - ප්‍රැන්සිස්කන්වරුන් |
| සතර කෝරළය | - ඔගස්ටීනියන්වරුන් |
| සත් කෝරළය | - ජේසුයිට්වරුන් |
| සබරගමුව | - ඩොමිනිකන්වරුන් |

කපිතාන් ජනරාල්වරයාගේ උපදේශක මණ්ඩලයේ පූජකවරයකු සිටීමෙන් ආගමට ප්‍රමුඛස්ථානයක් ලබා දී ඇති බව පෙනේ.

මෙරටට පැමිණි මුල් අවස්ථාවේ සිට ම පෘතුගීසීහු නොපසුබට උත්සාහයෙන් කතෝලික ධර්ම ප්‍රචාරණ කටයුතුවල නියැළුණහ.

උදාහරණ - ධර්මපාල කුමරා කතෝලික ආගමට හරවා ගැනීම එබඳු එක් අවස්ථාවකි.

ජනතාව කතෝලික ආගමට හරවා ගැනීම සඳහා පෘතුගීසීන් අනුගමනය කළ ක්‍රියාමාර්ග කිහිපයක් තිබුණි.

1. කතෝලික ආගම වැළඳගත් අයට වරප්‍රසාද, දීමනා හා රජයේ තනතුරු ලබා දීම.
2. බදුවලින් නිදහස් කිරීම.
3. අධ්‍යාපනය ලබා දීම.
4. ජනතාවගේ සිත් ඇදගන්නා සුලු උත්සව හා පෙරහර සංවිධානය කිරීම.
5. ශුභ සාධන කටයුතු

ගම්වල වැසියන් සමඟ මිත්‍රශීලි ලෙස හැසිරෙමින් ජනතාවගේ සිත් දිනා ගැනීමට මිෂනාරීවරු කටයුතු කළහ. ලෙඩදුකින් පීඩාවට පත් අයට බටහිර වෛද්‍ය ක්‍රමයට ප්‍රතිකාර කිරීම හා සාත්තු සේවක කටයුතු සිදු කළ අතර රෝගීන්ට ප්‍රතිකාර කිරීමට ස්පිරිටන් නමින් හැඳින්වූ ආරෝග්‍යශාලාවක් ඉදි කරන ලදි. වර්තමානයේ භාවිත කරන ඉස්පිරිතාලය යන වචනය එයින් බිඳී ආවක් යැයි ද විශ්වාසයක් පවතී.

## මඩම් පිහිටුවීම

නැති බැරි අය රැකබලා ගැනීම, අනාථයන්ට ඉගැන්වීම ආදිය සඳහා බොහෝ ප්‍රදේශවල මඩම් පිහිටුවිය. මේවා මීසරි කෝසියා යනුවෙන් හැඳින්වේ. කොළඹ, ගාල්ල, මන්නාරම, යාපනය යන ප්‍රදේශවල මෙම මඩම් ඉදි කෙරිණ.

පල්ලියට යාබදව පාසල් පවත්වාගෙන යන ලදි. ඒවා පැරිෂ් පාසල් යනුවෙන් හැඳින්විය. ආගම ප්‍රචාරය කිරීමට පෘතුගීසීන් විසින් අධ්‍යාපන කටයුතු යොදා ගන්නා ලදි. කතෝලික ආගම හැදෑරීම අනිවාර්ය විය. රජයේ ආධාරවලින් ගම්වල පැරිෂ් පාසල් ඉදි විය.

## පෘතුගීසීන්ගෙන් මෙරට සංස්කෘතියට එකතු වූ නවාංග

සියවස් එකහමාරක පමණ කාලයක් පැවති පෘතුගීසි කටයුතු හේතු කොටගෙන දේශීය සංස්කෘතියට යම් යම් බලපෑම් සිදු විය. මේ නිසා පෘතුගීසි සංස්කෘතියේ ඇතැම් ලක්ෂණ දේශීය සංස්කෘතියට මිශ්‍ර විය. ඒවා අප සමාජයේ තදින් ම මුල්බැසගෙන ඇති අතර අදටත් භාවිතයේ පවතී. පුද්ගල හා පෙළපත් නාම, ආහාර, ඇඳුම් පැලඳුම්, කලාව, සංගීතය යන අංශ යටතේ මේ ලක්ෂණ හඳුනාගත හැකි ය.



**ක්‍රියාකාරකම**

1. ලංකා සිතියමක පහත සඳහන් ස්ථාන ලකුණු කරන්න.

◈ කොළඹ, කෝට්ටේ, මන්නාරම, ගාල්ල, මහනුවර, යාපනය නගරය, සීතාවක

2. පෘතුගීසීන්ගේ පාලනය, ආර්ථික කටයුතු සහ සමාජ සංස්කෘතික තොරතුරු ඇසුරින් පුවත්පතකට ලිපියක් ලියන්න.

